# සීගිරි සිංහපාද පිළිබඳ නැවත විමසා බැලීමක්

ඩබ්ලිව්. ඉෂංඛ මල්සිරි[1]


## හැඳින්වීම

සීගිරි පර්වතයේ උතුරු දෙස පටු තැනිතලා බිමෙක පිහිටා ඇති 'සිංහ පාද' නමින් හැඳින්වෙන ඉදිකිරීම් අවශේෂය වර්තමානයේ ඇතැමුන්ගේ දැඩි සැකයට බඳුන්වී තිබේ. එහි පාදවල ඇඟිලි සංඛ්‍යාව හා නියපොතුවල දිගටි උල් ස්වරූපය නිසා මෙය සිංහ පාදයක් නොව ගුරුළු හෝ වෙනත් පක්ෂි පාදයක් විය යුතු යැ යි ද, ඒ අනුව එකල මෙහි ඉදිකර පැවති මූර්තිය සිංහයෙකු පිළිබිඹු නොකරන ලද්දේ යැ යි ද මේ විකල්ප මතවලින් කියැවේ. එබැවින් අදාළ අවශේෂ පිළිබඳ ශාස්ත්‍රීය පර්යේෂණයක් ඔස්සේ යම් නිගමනයකට එළඹීමට මෙයින් අපේක්ෂා කෙරෙයි.

## ක්‍රමවේදය

විකල්ප මතයෙන් ඉදිරිපත් කෙරෙන විරෝධතා මූලිකව හඳුනා ගැනිණි. අනතුරුව එම අවශේෂ සොයා ගැනීම හා සංරක්ෂණය කිරීමට අදාළ පුරාවිද්‍යා වාර්තා පරීක්ෂා කරන ලද අතර මෙසපොතේමියාව, ඊජිප්තුව, ග්‍රීසිය හා රෝමය, ඉන්දියාව මෙන්ම ලංකාවේ ද පැරණි සිංහ මූර්තිවල ශරීර අංග නිරූපණ අවධානයට ලක් කරන ලදි. ශේෂව ඇති කොටස්වල විද්‍යමාන ලක්ෂණ එකී මූර්තිවල නිරූපණ සමග සසඳා බැලීම මගින් ඇතැම් ගැටලු විසඳා ගත හැකි විය. මෙම රූපීය ලක්ෂණවලට අමතරව වක්‍ර සාක්ෂ්‍ය ලෙස කුරුටු ගීවල අන්තර්ගත ප්‍රයෝජනවත් දත්ත ද උපයෝග කර ගැනුණි. තවදුරටත් සත්ත්වවිද්‍යාත්මක දත්ත අවධානයට ලක් කිරීම මගින් මූලික එළඹුම් වඩා ශක්තිමත් කර ගත හැකි විය.

## ප්‍රතිඵල

පර්යේෂණයෙන් ලද දත්ත විශ්ලේෂණය කිරීම මගින් මෙතෙක් මතභේදයට ලක්ව ඇති ස්මාරක අවශේෂය සිංහ මූර්තියකට අයත් පාද බව තහවුරු වූ බැවින් රාවණ මතධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන පක්ෂි පාද ප්‍රවාදය ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ මගින් සීගිරියේ නාමකරණය සම්බන්ධයෙන් මහාවංසගත තොරතුර සනාථ වීම ද සැලකිය යුතු වැදගත් කරුණකි. මෙම පාදවල නිරූපිත ඇඟිලි සංඛ්‍යාව හතරක් බවත්, එක් ඇඟිල්ලක් නිරූපණය නොකිරීම ක්ෂයවෘද්ධි ලක්ෂණ අනුගමනය කිරීමේ ඵලයක් බවත් මෙයින් හෙළි වූ අවශේෂ කරුණු වෙයි.


[1] imalsiri84@gmail.com

**සාකච්ඡාව**

හතරැස් අඩි 90ක හා උසින් අඩි 30ක අවකාශයේ රැස්ව පැවති ගරා වැටුණු ගඩොලු සුන්බුන් කැණීමට ලක් කරන ලද්දේ 1898 දී එච්. සී. පී. බෙල් විසිනි. තරමක් කැණීම් කළ පසුව ඒවා ඇත් හිස් නිරූපණ යැ යි සිතූ නමුත් අවසානයේ එම අදහස අනාථ විය. මේ මචිත කරවනසුලු සොයාගැනීම දැවැන්ත සිංහයෙකුගේ පාද බව පෙනී ගිය අතර එය සිහිගිරි නාමකරණය සිහිගන්වන ලදි. අනතුරුව 1903, 1904, 1907, 1908, 1909 යන වර්ෂවල දී මේ ආශ්‍රිත සංරක්ෂණ කටයුතු හා ශක්තිමත් කිරීම් සිදු කර තිබේ. 1936 වර්ෂය අවසන්වන විට සිංහ පාද මුල් තත්ත්වයට ප්‍රතිෂ්ඨාපනය කරන ලද්දේ, රූපය සම්පූර්ණව පැවති විට එහි ප්‍රමාණය කෙතෙක් දැ යි නරඹන්නන්ට අදහසක් ලබා දෙනු පිණිස ය.

හිටපු කොමසාරිස්වරයෙකු වූ ලෝංහර්ට්ස් විසින් මේ පාදවල ස්වරූපය සිංහයෙකුගේ යැ යි පෙනෙන පරිදි හැඩගස්වන ලද බව කියැවේ. කෙසේ වෙතත් 1937 පුරාවිද්‍යා වාර්තාවේ දී, සැම නියපොත්තක් වටාම ඇති ද්විත්ත්ව රේඛා මගින් ඒවා සැඟව පවතින කෝෂය පෙන්නුම් කරන නමුත් සමාන දිගු හා උල් නියපොතු සැබෑ සිංහයෙකුට වඩා ගොදුරු බුදින පක්ෂියෙකුගේ වැනි බව සඳහන් කර තිබේ. මුල් ඡායාරූප හා නූතන නිරූපණය සැසඳීමේ දී නියපොතුවල යම් වෙනසක් සිදුව ඇති බව පැහැදිලි ය. එහෙත් එපමණෙකින් මේ ගැටලුවට විසඳුමක් නොලැබෙයි. නියපොතුවල පළල ඇඟිලිවල පළලට සමානවීම සීගිරි පාදවලට පමණක් අනන්‍ය ලක්ෂණයක් නොවන බව ද සිහිකටයුතු ය.

සිංහපාදයේ ඇඟිලි තුනක් පමණක් පැවතීම ප්‍රධාන ගැටලුවක් වී තිබේ. සත්ත්වවිද්‍යාත්මක දත්තවලට අනුව සිංහයෙකුගේ ඉදිරි පාදවල පහ බැගින් ඇඟිලි 10ක් ද, පිටුපස පාදවල හතර බැගින් ඇඟිලි අටක් ද පවතියි. ඉදිරි පාදයේ ඇතුළු ඇඟිල්ල එනම් මහපටැඟිල්ල පිහිටනුයේ තරමක් ඉහළින් කුඩාවට ය. එම නිසා සිංහ පා සලකුණක සටහන් වන්නේ ඇඟිලි සතරක සලකුණු පමණි. සාරානාත් කුලුනු හිසේ සිංහ රූපවල මේ ඇඟිලි පහ ස්වාභාවික පිහිටීම් අනුව කැටයම් කොට ඇත. සාංචි තොරණේ මූර්ති අතර සම දිගින් යුත් ඇඟිලි පහකින් යුතු ඉදිරි පාද සහිත ඒකාබද්ධ සිංහ රූප නිමවා තිබේ. එහෙත් ඉන්දියාවේත්, ග්‍රීසිය හා රෝමයේත්, විශේෂයෙන් ඊජිප්තුවේ ස්පින්ක්ස් වැනි මූර්තිවලත් ඇඟිලි හතරක් පමණක් දක්වන අවස්ථා සුලබ වන අතර කුඩා ඇඟිල්ල නිරූපණය වනු දක්නා නොලැබෙයි. ඒ අනුව ඇඟිලි පහ හෝ හතරක් දැක්වීම අස්වාභාවික නොවන්නකි.

සීගිරි පාදවල දකුණු පාදයේ දකුණු සීමාව හොඳින් නිරීක්ෂණය කළහොත් එහි වඩා පිටුපසින් කුඩාවට නිරූපිත තවත් ඇඟිල්ලක් දැකගත හැකි වනු ඇත. පාද සමමිතික බැවින් මුල් අවස්ථාවේ දී වම් පාදයේ ද මේ ඇඟිල්ල එලෙස ම දක්නට ලැබුණු බව නිසැක ය. එක් ගැටලුවකට විසඳුමක් ලබා දෙමින් සීගිරි පාද

ඇඟිලි තුනකින් යුතු ය යන අදහස පහසුවෙන් ඉවත දැමීමට එයින් අවස්ථාව සැලසේ. එහෙත් කුඩාවට දක්වන්නේ ඇතුල් මහපටැඟිල්ල බැවින් එය නිරූපණය කළ යුතුව තිබුණේ පාදවල ඇතුල් පැත්තෙනැ යි තර්ක කිරීමට පුළුවන. බෙහෙවින් සාධාරණ යැ යි පෙනී යන මේ ගැටලුව විසඳීම පිණිස සිය ගණනක් වූ පැරණි සිංහ මූර්ති අධ්‍යයනය කිරීමට සිදු විය. අවසන ක්‍රි. පූ. 6 සියවස තරම් කාලයට අයත් පළමුවන ඩේරියස් රාජ්‍ය කාලයේ නිමකළ සිංහ ප්‍රතිමාවක් අපට අභිමුඛ විය. එහි ඉතා පැහැදිලිව මේ කුඩා ඇඟිල්ල පාදයේ පිටත පිටුපසින් නිරූපණය කර ඇති ආකාරය දක්නා ලැබේ. ඉතා දුර්ලභව වුවත් සීගිරි පාදවලට සමාන නිරූපණ සපයා ගත හැකි බවට මේ නිදසුනකි. ක්‍රි. පූ. 07 සියවසට අයත් ඇසිරියානු කැටයම් අතර ද මේ ලක්ෂණ සහිත සිංහ රූප හඳුනාගත හැකි ය. එයින් කුඩා ඇඟිල්ල ස්ථානගත කිරීම පිළිබඳ ගැටලුව ද මග හැරෙයි.

කෙසේ වෙතත් පස්වැනි ඇඟිල්ලක් නිරූපණය නොකරන ලද්දේ කුමක් නිසා දැ යි තවදුරටත් ප්‍රශ්න කළ හැකි ය. ඇතැම් සිංහ මූර්තිවල ඇඟිල් සතරක් පමණක් ඇති බව මීට ඉහත පෙන්වා දුනිමි. ඊට වෙනස් පිළිතුරක් ද ලබා දිය හැකි ය. ඇඟිලි පහ දර්ශනය වීමට නම් පාද ශරීරයට සමාන්තරව ඉදිරියට යොමු කර සිටිය යුතු වෙයි. සාරානාත්හි සිංහ රූප මෙනි. එනමුත් සියුම්ව නිරීක්ෂණය කරන්නෙකුට සීගිරි දොරටුවේ පාද එලෙස ඍජුව තබා නොසිටින බවත්, ඒවා පඩිපෙළ දෙසට නවා ගත් ආකාරයකින් තබා සිටින බවත් පෙනී යනු ඇත. මෙය වඩා හොඳින් වටහා ගත හැක්කේ තරමක් ඉහළ සිට නැරඹීමෙනි. එවැනි අවස්ථාවක දී ඇතුළු ඇඟිල්ල ඉදිරිපස සිටින්නෙකුට දර්ශනය නොවෙයි. එබැවින් එය නිරූපණය කිරීමේ අවශ්‍යතාවක් ද පැන නොනඟියි. මෙසේ ඉදිරියට පෙනෙන සේ නිරූපණය කිරීම චිත්‍ර කලාවේ දී 'ක්ෂයවෘද්ධි ලක්ෂණ' සේ හඳුන්වනු ලැබේ. නිතලොව විහාරයෙන් හමුව ඇති සිංහ කැටයමක් මීට නිදසුන් කළ හැකි ය. එහි මධ්‍යගත සිංහ රූපය ඉදිරි දෙකකුල් දෙපසට හරවා සිටින බැවින් කුඩා ඇඟිල්ල ද ඇතුළුව ඇඟිලි හතරකට පමණක් සීමා කර තිබේ. පාර්ශ්වීය සිංහ රූපවල ඇඟිලි සංඛ්‍යාව තුනකට සීමා වන්නේ ද මේ සාධකය කෙරෙහි පදනම්ව ඇති බැවිනි.

සීගිරියට එම නාමය ලැබුණේ සිංහ රූපයක් නිසා බව වංසකතාව පැහැදිලිව පවසයි. මෙම නටබුන් හැරුණු විට එතරම් වැදගත්කමකට හේතු වූ සිංහ මූර්තියක් හෝ සිතුවමක් සීගිරියෙන් හමුව නැත. කැඩපත් පවුරේ කුරුටු ගී අතර සිහිමියන් (no.45), සිහිඳුන්(no.174), සීරජු(no.205), සී (no.476), සීහිමියා (no.286), සිහිමියන් (no.576) ආදී වශයෙන් සිංහ රූපය පිළිබඳ ඍජු නිරූපණ ඇතුළත්ව තිබේ. සිංහ රුව මුල් කර ගත් සීගිරි (no.20, 55, 102, 168, 231, 387, 435, 479, 510, 560, 652, 675, 122), සීගිරියට (no.79), සීගිරියෙ (no.526), සිහිගිරි (no.28, 62, 72, 82, 174, 197, 295, 305, 316), සිහිගිරි (no.69, 144, 162, 205, 256, 272, 455,

476, 503) යන යෙදුම් මගින් ද ඉහත සිංහ පාද පිළිබඳ අදහස තහවුරු කෙරෙයි. පක්ෂි රුවක් පිළිබඳ මේ කිසිවක සඳහන්ව නැත.

### සමාලෝචනය

සීගිරි පර්වතයේ උතුරු දෙස පටු තැන්නක ගඩොලින් හා බදාමයෙන් නිමවා ඇති පා යුගල මුල් ස්වරූපයෙන් තරමක් වෙනස් විය හැකි නමුදු පැහැදිලිව ම සිංහ මූර්තියකට අයත් ඒවා ය. ඒවා පක්ෂි පාද යැ යි ද, ඒ අනුව මෙහි පැවතියේ පක්ෂි මූර්තියකැ යි ද පවතින මතවාද පුරාවිද්‍යාත්මක, සාහිත්‍ය හා අභිලේඛන සාධක මුළුමනින් ම නොතකා හැරීමෙන් ඇති කර ගන්නා ලද හිතලු වෙයි. එම අදහස් තහවුරු කළ හැකි විශ්වසනීය සාධක කිසිවක් ඉහත මූලාශ්‍රයෙන් සොයා ගත නොහැකි ය. පක්ෂි පාද ප්‍රවාදය ඉදිරිපත් කරන්නවුන් බොහෝවිට රාවණ මතවාදය ජනප්‍රිය කරන්නවුන් ය. සීගිරිය රාවණ රාජධානිය ය යන අදහස ඇති කරවන ලද්දේ ද ඔවුන් විසිනි. කෙසේ වෙතත් ප්‍රාථමික මූලාශ්‍රය නොතකමින්, ස්වකීය පූර්ව නිගමන සනාථ කිරීම පිණිස ප්‍රවාද නිර්මාණය කිරීමෙන් ඓතිහාසික දත්තවලට සිදුවන හානිය සුළුවෙන් තක්සේරු කළ නොහැකි ය. මේ නිසා ඓතිහාසික සාකච්ඡාවන්හි දී හා විශේෂයෙන් පුරාවිද්‍යාත්මක දත්ත අර්ථකථනයේදී පර්යේෂකයන් මනා ශික්ෂණයකින් යුතුව කටයුතු කිරීම බෙහෙවින් වැදගත් මෙන් ම අත්‍යවශ්‍ය ද වෙයි.

ප්‍රමුඛ පදඃ සිංහ පාද, සීගිරිය, පක්ෂි පාද, ක්ෂයවෘද්ධි, කුරුටු ගී

### ආශ්‍රිත ග්‍රන්ථ

*මහාවංසො*,(1959),(සංස්.),පොල්වත්තේ බුද්ධදත්ත හිමි කොළඹඃ ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

Paranavitana, S.(1956).*Sigiri Graffiti*, Vol.ii, London: Oxford University Press.

Bell, H. C. P.(1904).*Archaeological Survey of Ceylon Annual Report 1898*, Ceylon: Government Printer.

Bell, H. C. P.(1908). *Archaeological Survey of Ceylon Annual Report 1895*, Ceylon: Government Printer.

Longhurst, A. H.(1937).*Archaeological Survey of Ceylon Annual Report 1936,* Colombo: Government Press.